**2022 පෙබරවාරි මස 17 වන දින පැවති**

**හතළිස් හය වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.02.17**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්. බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ. ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | ජේ. ඒ .ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | ජේ. ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | පී. එස්. බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | ඩී. පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **09.** | ගරු මන්ත්‍රී | ආර්. එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **10.** | ගරු මන්ත්‍රී | එම්. ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **11.** | ගරු මන්ත්‍රී | ජී. ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | එස්. ඒ. කේ. පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **14.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **15.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **16.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **17.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **19.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **20.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

**03.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී කේ.ජී.ඒ සම්මානි මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2022.01.18 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා 2022.01.18 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සලස්වා ඇති බැවින් එම වාර්තාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.01.18 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2022.01.18 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධන යන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ අතර 2022.01.18 වන දින මහ සභා රුස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධන රහිතව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

**01. වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයට අදාල ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් යොමු කර ඇති ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. LDSP ව්‍යාපෘතියේ පළමු කාර්යය සාධන අරමුදලේ දෙවන කොටස් මුදල් හි ප්‍රතිපාදන ලැබීම්**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් පාලන ආයතන වෙත ලබා දීමට නියමිත පළමු කාර්යය සාධන අරමුදලේ දෙවන කොටස් මුදල ලෙස රු 8,717,949.00 ක මුදලක් හිමි වී ඇති බවත්, ඒ සඳහා විශ්ව විද්‍යාල ස්වාධීන විගණන කණ්ඩායම විසින් සිදු කරන ලද විගණනය මගින් ඒ ඒ පළාත් පාලන ආයතනය ලබා ගත් ලකුණු ප්‍රතිශතය අනුව හිමි වූ බවත්, ඒ අනුව උතුරු මැද පළාතේ වැඩිම අරමුදල් ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති ප්‍රාදේශීය සභාව ලෙස අප හැඳින්විය හැකි බව සතුටින් දන්වන බවට මහ සභාවට නිවේදනය කරන ලදී.

**03.ජපන් හා ඊශ්‍රායලයේ විදේශ රැකියා අවස්ථාවන් සඳහා තරුණ තරුණියන් බඳවා ගැනීම.**

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා ශ්‍රී ලංකාව සමඟ ජපන් හා ඊශ්‍රායල් රාජ්‍යයන් මගින් අත්සන් කරන ලද ගිවිසුමකට අනුව ජපන් රාජ්‍යයේ සාත්තු සේවක සේවිකාවන් සඳහා රැකියා අවස්ථාවන් රැසක් පවතින බවත්, ඒ සඳහා බඳවා ගැනීම සහ පුහුණු කිරීම සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවත්, ඒ සඳහා බල ප්‍රදේශය තුල සිටින සුදුසුකම් ලත් තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු නැ. නු. ප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදේශ රැකියා සංවර්ධන නිළධාරී වෙත යොමු කරන ලෙසට වූ ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**03. ග්‍රාමීය පාලම් අළුත්වැඩියා කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය ආර්ථිකය ශකිත්මත් කරලීම පිණිස ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ගමත් නගරයත් යා කරමින් අවම පිරිවැයකින් , කෙටි කාලයක් තුල කුඩා පාලම් අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අවධානය යොමු වී ඇති බැවින් මෙම බල ප්‍රදේශයේ

හඳුනාගත් ස්ථාන කඩිනමින් ලබා දෙන ලෙසට ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් යොමු කර ඇති ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 මාර්තු මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 මාර්තු මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා හා 2022 ජනවාරි මස දීපාල් ගමගේ මයාගේ අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2022 ජනවාරි</u>**

| | | **පැය ගණන** |
|---|---|---|
| 01. දීපාල් ගමගේ මයා | (සෞඛ්‍ය කම්කරු) | 30 |

**<u>2022 මාර්තු</u>**

| | | **පැය ගණන** |
|---|---|---|
| 02. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 03. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 04. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 05. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 06. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 07. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 10. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 11. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 12. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 13. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 14. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 16. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |
| 17. ඩබ් තිලකරත්න මයා | (කා.කා.සහයක) | 40 |
| 18. දීපාල් ගමගේ මයා | (සෞඛ්‍ය කම්කරු) | 40 |

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> 2022 මාර්තු මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා හා 2022 ජනවාරි මස දීපාල් ගමගේ මයාගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 මාර්තු මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා හා 2022 ජනවාරි මස දීපාල් ගමගේ මයාගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකගතාවයෙන් සභා සම්මත විය.

**02. ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති වාර්ථාව අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම යථාර්තයක් බවට පත් කර ගැනීම සහ නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කර ගනිමින් වස විසෙන් තොර ආහාර වේලක් සකසා ගැනීම අරමුණු කර ගනිමින්, කෘෂිකාර්මික භෝග වල ගුණාත්මක බාවය හා ඉහළ ඵලදාවක් ලබා ගැනීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ මේ වන විට අවධානය යොමු කර තිබෙන කාලයක මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ගෘහස්ථ ආර්ථිකය නගා සිටුවීමටත් දීර්ඝ කාලයක් තුල පුරුදු වී සිටි රසායනික පොහොර භාවිතයෙන් ඇතිවන ශාරිරික දුබලතාවයන් හා රෝගී තත්වයන් පිළිබඳ දැනුවත් කර කාබනික පොහොර භාවිතයෙන් මිනිස් සිරුරට ඇතිවන යහපත් ගුණාංග පිළිබඳව දැනුවත් කිරීම මෙන්ම ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරීමද යන අරමුණු පෙරදැරි කරගෙන සැළසුම් කර ඇති ව්‍යාපෘතිය තුල තරඟයේදී තෝරන ගෙවත්ත හා දෙවන, තුන්වන ගෙවතු සඳහාද සෑම තුලානයකම හොඳම ගෙවත්ත සඳහාද මුදලින් තෑගී ලබා දීමට කටයුතු කර ඇති බව සඳහන් කරමින් අදාල ව්‍යාපෘති වාර්ථාව මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර, ව්‍යාපෘති සැළසුමට අදාලව අදාල ගෙවතු වගා වැඩසටහන පැවැත්වීම සුදුසු බවට යෝජනා කරන ලදී.

පළමුවන ත්‍යාගය -රු 70,000.00
දෙවන ත්‍යාගය - රු 50,000.00
තෙවන ත්‍යාගය - රු 30,000.00
ග්‍රාම සේවා තුලානේ තෝරන ලද හොඳම ගෙවත්තට රු 5000 ක්ද
ඉදිරිපත් වන සෑම තරඟකරුවෙකු සඳහාම වටිනා සහතික පත්‍රයක්ද පිරිනැමීමට සූදානම් බවද සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ව්‍යාපෘති වාර්ථාව තුල සාර්ථකත්වයක් දක්නට ලැබෙන සේම වැඩ සැළැස්ම තුල ක්ෂේත්‍ර පරීක්ෂාව වෙනුවෙන් සංවර්ධන නිළධාරී කුමුදු මිය ලෙස සටහන් වනවාට වඩා ගෙවතු වගාව සම්බන්ධයෙන් හා කොම්පෝස්ට් පොහොර භාවිතය සම්බන්ධයෙන් විශේෂ දැනුමක් සහිත ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමාගේ නාමය ඇතුලත් කරන්නේ නම් වඩාත් සුදුසු බවත්, පෙබරවාරි මස බීජ බෙදා දීමෙන් අනතුරුව මැයි මස වන විට ඵලදාවක් ලබා ගත හැකි වේද යන්න හා වගා කන්නය පිළිබඳ ප්‍රශ්ණය ඒ තුල පැන නගින බවත් සඳහන් කරන ලදී.

තවද සිය අදහස් දැක්වීම තුල ආන්දෝලනයක් ඇති කිරීමට උත්සහ නොගත් බවත්, කයියට පමා වූවත්, කන්නට පමා නොවන්න ලෙස කියමනක්ද පවතිද්දී, පවතින කාලගුණයට ගැලපෙන ලෙස පවත්නා බීජ තෝරා ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා මෙවැනි කාලෝචිත යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව ස්තූති වන්ත වන බවත්, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයට අනුව වස විසෙන් තොර ආහාර ලබා දීම අරමුණු කර ගෙන අප විසින් ආරම්භ කිරීමට නියමිත මෙම ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා කාලය සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බවට තමන් විශ්වාස කරන බවත් රසායනික පොහොර භාවිතා කල යුතු බවට සඳහන් කලත් ඒ තුලද සත්‍යතාවයක් නොමැති බවත්, සඳහන් කරන ලදි.

තවද ප්‍රාදේශීය සභාව විසින් අවශ්‍ය සියළු තාක්ෂණික උපදෙස් හා මෙවලම් ලබා දෙමින් කාබණික ගෙවතු වගාව සිදු කරන්න සම්පූර්ණ සහයෝගය අප විසින් ලබා දිය යුතු වනවා සේම ඒ සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දිය යුතු බවත්, සඳහන් කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ආහාර සුරක්ෂිතතාවය ගෙවත්තක් තුල ඇති කරන්නේ කෙසේද යන්න මෙම වැඩසටහනෙන් පැහැදිළි වන අතරම කාලය යන කරුණ සම්බන්ධයෙන් පරිසරය සමඟ පොඩි ගැටළුවක් ඇති නමුත් ප්‍රාදේශීය සභාවක් ලෙස මෙම ගැටළුවට විසඳුම් ගෙන ශක්තිමත්ව වස විසෙන් තොර කාබනික ගෙවත්තක් අප කෙසේ හෝ ආරම්භ කල යුතු බව සඳහන් කරන ලදී.

තවද මෙම වැඩසටහන මීට මසකට පෙර ආරම්භ කලා නම් මීට වඩා සාර්ථක කර ගැනීමට හැකි වනු ඇති නමුත් ඉදිරියේදී අපගේ පවතින ඉදිරි දැක්ම තුල මෙම වැඩසටහන සාර්ථ
ක කර ගැනීමට හැකි වනු ඇති බව තමන් තරයේ විශ්වාස කරන බවත්, සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව තුල අප අනෙකුත් පාර්ශවයන්ගේ සහයෝගය ලබා ගැනීමට උත්සහ දැරිය යුතු අතර, අධ්‍යනය කරන ලද සෞභාග්‍යයේ දැක්ම සම්බන්ධව මීට සති 04 කට පෙර අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කල බවත්, කණ්ඩායමක් ලෙස තමන් ශ්‍රාවස්තිපුර එක් වෙල්යායක් තෝරා ගෙන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට සැළසුම් කර ඇති බවත්, එහි ව්‍යාපෘති වාර්ථාව ද තමන් විසින් සකස් කල බවත්, එහිදී කෘෂිකර්ම අමාත්‍යාංශය නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සමඟ පළාත් සභාවේ පැවති රැස්වීමකදී රසයනික පොහොර ගෙන ඒම නතර කිරීම සඳහා ගත් පියවර හදිසි වැඩි බවට පිළිගත් බවත්, මෙම ක්‍රියාදාමය නියමානුකූලව සකස් කර ජනතාව දැනුවත් කල යුතු බවත් සඳහන් කරන ලදී.

තවද මෙම ව්‍යාපෘතියේ කෙටි සංශෝධන කිහිපයක් ඇතුලත් කල යුතුව පවතින බවත්, මෙය කොට්ඨාශ 11 ම ක්‍රියාත්මක කල යුතු වන සේම විජයපුර හා වන්නියන්කුලම කොට්ඨාශ තුල අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී පවත්නා නාගරීකරණයත් සමඟ වගා කල හැකි භූමි ප්‍රමාණය අවම වන බැවින් බීජ සිටුවීම සඳහා අවශ්‍ය බඳුන් සඳහා බෑග් ලබා දීමේ අවශ්‍යතාවය හා කිරි හට්ටි/ඉවත ලන බෝතල් ආදි විකල්ප ක්‍රම භාවිතා කිරීමට අවශ්‍ය බවත්, ඒ අනුව මෙය නාගරික මට්ටමේ ගෙවතු හා ග්‍රාමීය මට්ටමේ ගෙවතු ලෙස විශේෂ බවක් දැක්වීම සුදුසු බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද බීජ ලබා දීමේදී නාගරික මට්ටමේ ගෙවතු සඳහා වැල් යන ශාක ලබා දීම ප්‍රායෝගික නොවන බවත්, තරඟකරුවන් තෝරා ගැනීමේදී දේශපාලනය යොදා නොගැනීම වඩාත් සුදුස බවත්, ගොවීන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්විය යුතු බවත්, එහිදි අදාල නිළධාරීන් පවා පුහුණුව සඳහා සහභාගී කරවන්නේ නම් සුදුසු බවත්, ව්‍යාපෘතිය බල ප්‍රෙද්ශයේ ජනතාවගේ ගෙවතු තුල ක්‍රියාත්මක කරනවා සේම ප්‍රාදේශිය සභා භූමියේද අදාල වැඩසටහන ක්‍රියාත්මක කරමින් ආදර්ශයක් සැපයිය යුතු බවත් සඳහන් කරන ලදී.

තවද කෘෂිකර්ම සංවර්ධන නිළධාරීන් අප බල ප්‍රදේශයටම දෙදෙනෙකු පමණක් සිටියදී, අපට උපදෙස් ලබා ගැනීම සම්බන්ධයෙන් විශාල ගැටළුවක් පැනනැගිය හැකි බවත්, ගොවිජන සේවා කොමසාරිස්තුමා හරහා

අනෙකුත් අධීක්ෂණ නිළධාරීන්ගේ සහයෝගය ලබා ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කල යුතු බවද සඳහන් කරන ලදී.
තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා මෙම වැඩසටහන සඳහා බල ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරුන්ද අධීක්ෂකයන් ලෙස යොදා ගන්නා ලෙසත්, කරුණු දක්වන ලදී.

තවද බීජ මිල දී ගැනීමේ දී මහ ඉලුප්පල්ලම කාෂි පර්යේෂණ ආයතනයෙන් හෝ ගන්නෝරුව කෘෂි පර්යෙෂණ ආයතනයෙන් බිජ මිල දී ගත යුතු බවත්, එහිදී සෙද්ශීය බීජ තෝරා ගැනීම කෙරේ අවධානය යොමු කල යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙවැනි වැඩසටහනක් ආරම්භ කර තරඟයක් පවත්වා එය එතනින් නතර නොකර ඉදිරියට යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය පවතින බවත්, නාච්චාදූව ව්‍යාපාරය තුල 90% ක් පමණ සිටින ගොවීන් මඟින් පැවතගෙන ආ කෘෂිකර්මාන්තය එක් රැයින් ගත් තීරණය සමඟ මේ වන විට රටේ ආහාර සුරක්ෂිතතාවය පහල වැටී තිබෙන බවත්, මීට ඉහතදී ආහාර සුරක්ෂිතතාවය අතින් ලෝකයේ 60 වන ස්ථානයේ පසු වූ ශ්‍රී ලංකාව මේ වන විට 94 වන ස්ථානයට වැටී ඇති නමුත් තවමත් ඒ සඳහා ප්‍රමාද නොමැති බවත්, එහිදි 100% ක් කාබණික පෙහොර යොදා ගැනීමෙන් පමණක් කෘෂිකර්ම කටයුතු සිදු කල නොහැකි නමුත් ආදාර්ශමත් ගෙවතු වගාවක් සිදු කිරීමේ හැකියාව තිබෙන හෙයින් අපගේ වැඩසටහනේ ගුණාත්මක තත්වය නැංවීම උදෙසා ප්‍රථමයෙන් ම ගොවි ජනතාව අවංකභාවය පිළිබඳ දැන්වත් කල යුතු බවත්, නැතිනම් ඔවුන් තරඟය ජයග්‍රහණය කිරීමේ අදහසින් රසායණික පොහොර භාවිතා කිරීමට කටයුතු කරනු ඇති බවත්, තරඟකරුවන් තෝරා ගැනීමේදී දේශපාලනය කිසි ලෙසකින්වත් ගාවා නොගත යුතු බවත්, සඳහන් කරන ලදි.

තවද අපට දැවැන්ත කොම්පෝස්ට්ගාරයක් තිබියදී එය නිසි කළමණාකාරිත්වයක් නැති වීම මත අපට මුදලට කොම්පෝස්ට් පොහොර ගෙන්වීමට සිදු වී තිබෙන බවත්, බීජ සිටුවීම සඳහා අදාල කාලය භාවිතා නොකිරීම තුල ද ගැටළුවක් ඇති විය හැකි බවත්, කෘමීන් මර්ධනය කිරීමේ ගැටළුව ඒ අතර ප්‍රධාන වන බවත්, සඳහන් කරන ලද අතර කෙසේ හෝ මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව වසර 10 ක් වත් ඉදිරියට පවත්වාගෙන යා යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> ව්‍යාපෘතිය තුල කුඩා ගැටළු ප්‍රමාණයක් පවතින බවත්, එහිදී කෘෂි සංවර්ධන නිළධාරීන් සම්බන්ධ කර ගැනීමේ පවතින අපහසුතාවයත්, කාෂිකර්ම නිෂ්පාදන පර්යේෂණ සහකාරවරුන්ගේ හා ගෙවිජන සේවා නිළධාරීගේ සහභාගීත්වය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, ඒ සඳහා ඔවුන්ට යම් මුදලක් ගෙවීමේ හැකියාව පවතින්නේ නම් සුදුසු බවත්, ඊට අමතරව මෙම ව්‍යාපෘතියේදී 50% ක් රසායණික පොහොර ලබා දීමේ හැකියාව පවතින්නේ නම් මෙය වඩාත් සාර්ථක වන බවත්, එසේ නොමැතිවුවහොත් වසරක් ගත වීමෙන් පසුව දරණ ලද වියදම් වලින් ප්‍රයෝජනයක් නොලැබී යන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> අතිගරු ජනාධිපතිතුමාගේ කාබණික පොහොර භාවිතය සිදු කිරීම සඳහා ගෙන ආ සංකල්පය බිම් මට්ටමට ගෙන ඒම සම්බන්ධයෙන් ගැටළුවක් පැවති බවත්, එහිදී සංවර්ධන නිළදාරීන් හරහා ගොවීන් දැනුවත් නොකිරීම මෙයට බලපෑ ප්‍රධාන හේතුව බවත්, ඒ තුල අසාර්ථකත්වයක් දුටු නමුත් තම කොට්ඨාශයේ ගොවි ජනතාව දැනුවත් කර පොහොර ඇතුව හෝ නැතුව හෝ ගොවිතැන් කටයුතු ආරම්භ කරන ලෙස දැනුම් දුන් බවත් ඒ අනුව වගා කටයුතු ආරම්භ කල ගොවි මහතුන් අද වී බුසල් 50 ක් හෝ ලබා ගත් බවත්, සඳහන් කරන ලදී.

තවද මෙවර යල කන්නය සාර්ථක වූවා සේම මෙම ගෙවතු වගා වැඩසටහනත් සාර්ථක වේවි යන්න තමන් තරයේ අපේක්ෂා කරන අතරම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අප මේ සඳහා සහයෝගය ලබා දිය යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ගෙවතු වගා ව්‍යාපෘතියක් මෙලෙස ආරම්භ කිරීම සඳහා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් සතුටු වන නමුත් නිවැරදි ක්‍රම වේදයන් අනුගමනය නොකලහොත් අසාර්ථක විය හැකි වුවත්, කාබනික පොහොර නිසි පරිදී භාවිතය තුලින් හොද අස්වැන්නක් ලබා ගැනීමේ හැකියාව අනිවාර්යෙන්ම හිමි වන බවත්, රසායනික පොහොර නැත යන්න සඳහන් කරමින් වී අස්වැන්න අඩුවෙන් ලබා ගත්තත්, වී මිල ඉහල යාම තුල වැඩි ආදායමක් ලබා ගැනීමේ හැකියාව හිමි වූ අතර පාරම්පරික වී වර්ග භාවිතා කිරීමේ හැකියාව පවතින්නේ නම් ඒ සඳහා වැළදෙන රෝග ප්‍රමාණයන් අවම වන බැවින් අපගේ වැඩසටහන සඳහාත් පැරණි බී ජ යෝදා ගැනීමේ හැකියාව පවතින්නේ නම් වඩාත් සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා පැවසූ කාලය සම්බන්ධ ගැටළුව සැළකිල්ලට ගත යුතු නමුත්, සුළු පරිමාණයෙන් සිදු කරන ගෙවතු වගාවක් බැවින් අපට විශාල ගැටළුවක් ඇති නොවන බව සඳහන් කරන ලදී.

තවද අප මෙම තරඟයේ ලකුණු දෙන වැඩ පිළිවෙලක් සකස් කර තිබෙන බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමාගේ නම ඇතුලත් නොකලේ, ගරු මන්ත්‍රීවරුන් කිසිවකුගේ නම් ඇතුලත් නොකල නිසා බවත්, බෝග වගාව පිළිබඳව දැනුවත් කරනවාට වඩා කොම්පෝස්ට් පොහොර පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වුවමනාව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් වන පළමු වැඩසටහන සඳහා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සහභාගි කරවා ගන්නා බවත්, සඳහන් කරන ලදී.

තවද කෘෂිකර්ම උපදේශක තුමන්ලා වෙත දීමනාවක් ගෙවීමට මුලින් සිතා සිටියත් ඔවුන්ට රජයෙන් වැටුපක් ගෙවන බැවින් හා ඔවුන්ගේ සේවාව ලබා ගැනීමක් සිදු කල යුතු නිසාත්, මෙවැනි වැඩසටහන් සඳහා ඔවුන් දැඩි කැමැත්තෙන් සහභාගී වන බැවින් ගැස්තුවක් ගෙවීමට අවශ්‍ය නොවන බවට තීරණය කල බවත්, අවශ්‍යනම් අදාල නිළධාරී මහතුන් වෙත යම් දීමනාවක් ගෙවීමේ හැකියාව පවතින බව ද කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා වෙළඳපලේ විවිධ වර්ගයේ බීජ වර්ග පවතින බවත්, එහිදී පිටරටින් ආනයනය කරනු ලබන බීජ ලබා දීමෙන් වැළකී සිටිය යුතු සේම ගෙවතු වගා වැඩසටහනක් වන බැවින් සුළු ප්‍රමාණයකින් බීජ ලබා දීම සුදුසු බවත්, තක්කාලි , බටු , මිරිස්, වැනි බෝග තවාන් මගින් ලබා ගත යුතු වන බැවින් එවැනි බෝග නිසි ප්‍රමිතියෙන් සකස් කර ගැනීම අනිවාර්යෙන් සිදු කල යුතු බැවින් එවැනි බෝග ගෙවතු හිමියන්ට සකස් කර ගැනීමට ඉඩ සලසා එවැනි බීජ ලබා නොදීමට පියවර ගනිමුයි යන්න සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර යෝජනාව සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති වාර්ථාව අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටින ගරු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත සභා සම්මත විය.

**03. LDSP ව්‍යාපෘතියේ පළමු කාර්යය සාධන අරමුදලේ දෙවන කොටස් මුදල වියදම් කිරීම සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පළාත් පාලන ආයතන වෙත ලබා දීමට නියමිත පළමු කාර්යය සාධන අරමුදලේ දෙවන කොටස් මුදල ලෙස හිමි වූ රු 8,717,949.00 ක මුදල යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බැවින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|
| 01 | සූර්යය බලශක්ති පැනල සවි කිරීම | 7,000,000.00 |
| 02 | විජයපුර ප්‍රදේශයේ කාණු පද්ධතිය ඉදි කිරීම. | 1,717,949.00 |
| **එකතුව** | | **8,717,949.00** |

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> විජයපුර මංසන්දිය තුල ආරක්ෂාව සම්බන්ධයෙන් සැබෑ ගැටළුවක් පවතින බවත්, සභා අරමුදල් හෝ යොදවා අදාල භූමියේ ඇති තරා පැවිය ඉවත් කර වටරවුම සකස් කරන ලෙසට යෝජනා කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අදාල ව්‍යාපෘතිය යටතේ අදාල යෝජනාව ඇතුලත් කල හැකිද යන්න පිළබඳව අවධානය යොමු කරන බව සඳහන් කරමින්, ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ කැමැත්ත පරිදී සභා සම්මත විය.

**04. ණය කමිටුව පත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රාදේශීය සභා සේවක මහත්ම මහත්මීන් සඳහා ණය මුදල් ලබා දීමේදී ඊට අදාල නෛතික අනුමැතිය ලබා දීම වෙනුවෙන් කාර්යාලය තුල ණය කමිටුවක් පත් කල යුතුව පවතින අතර ඒ සඳහා පහත සඳහන් ණය කමිටුව පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

කමිටුවේ සභාපති - ලේකම්, බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
කමිටුවේ සාමාජික - ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී, අයි.ජී.සී.එන් වීරකෝන් මිය
කමිටුවේ සාමාජික - තාක්ෂණ නිළදාරී, ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> පත් කරන ලද කමිටුව සම්බන්ධයෙන් හා ණය මුදල් ලබා දීම වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබා ගත යුතු බව සඳහන් කරමින් මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> එම යෝජනාව ස්ථිර කරන ලද අතර, ඒ අනුව මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් විය.

ලේකම් තුමා විසින් කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමාගේ හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් විය.

<u>මහ සභා අවස්ථාව</u>

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> අදාල කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පළාත් පාලන ආයතනයකට සේවකයෙකු පත් වී පැමිණි පසු බොහෝ දුරට ණය මුදල් ලබා දීමේදී අවශ්‍ය සීමාව යටතේ ලබා දීම සම්බන්ධව අවධානය යොමු කිරීම සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා රජය විසින් ඉදිරිපත් කර ඇති නීතිමය රාමුව තුල 40% ක ණය මුදල් සීමාව තබා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමින්, ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ණය කමිටුව පත් කිරිමේ යෝජනාව පැමිණ සිටි ගරු මන්ත්‍රිවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05. දුක් ගැනිවිලි නිළධාරීන් පත් කිරීම හා ඊට අදාල කමිටු පිහිටුවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ජනතාවගේ දුක් ගැනවිලි සම්බන්ධෙයෙන් හා ආයතනයේ නිළධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් කමිටු පත් කර ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ප්‍රජාව වෙනුවෙන් පත් කල දුක්ගැනවිලි කමිටුව**

01. ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා - කමිටු සභාපති
02. අදාල කොට්ඨාශයේ ගරු මන්ත්‍රි තුමිය හෝ ගරු මන්ත්‍රිතුමා -කමිටු සාමාජික
03. සභා ලේකම් -බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා - කමිටු සාමාජික
04. ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී, අයි.ජී.සී.එන්.වීරකෝන් මිය - කමිටු සාමාජික
05. තාක්ෂණ නිළධාරී ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා -කමිටු සාමාජික

**ආයතනික නිළධාරීන් වෙනුවෙන් දුක්ගැනවිලි කමිටුව**

01. සභා ලේකම් - බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා - කමිටු සාමාජික
02. ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී, අයි.ජී.සී.එන්.වීරකෝන් මිය - කමිටු සාමාජික
03. තාක්ෂණ නිළධාරී ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා -කමිටු සාමාජික

**අභියාචනා නාළධාරියා**

01. එස්.බී කුමාරදාස මැතිතුමා - ගරු සභාපති

ගරු මන්ත්‍රි ඩී.පී බන්දුලසේන මැතිතුමා මේ සඳහා දුක්ගැනවිලි භාර ගැනීම සඳහා යම් නිළධාරියෙකු පත් කර සිටින්නේ ද යන්න විමසන ලදී. තමන් දන්නා පරිදී යම් දුක් ගැනවිලි නිළධාරීයෙකු පත් කල යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රිවරයෙකුට හෝ ගරු මන්ත්‍රිවරියකට යම් අසණීප තත්වයක පසු වුවහොත් ඒ සම්බන්ධයෙන් අනෙකුත් ගරු සභිකවරුන් දැනුවත් කිරිම සඳහා යම් ක්‍රමවේදයක් පවතින්නේ ද යන්නත්, ඒ සඳහා යම් වැඩපිළිවෙලක් සකස් කිරීම වඩාත් සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර, කොවිඩ් වසංගතය වැළඳුනු යම් නිළධාරියෙකු හෝ ගරු සභිකවරයෙකු සිටින්නේ නම් ඒ සඳහා රු 5000 ගෙවීම් කිරීම සඳහා ලබා ගත් තීරණය අවශ්‍ය අවස්ථාවේදී ඉටු කර ගත නොහැකි නම් එහි ප්‍රයෝජනායක් නොමැති බව සඳහන් කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රි ඩී.පී බන්දුලසේන මැතිතුමා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමණාකරණයේ එක් අංගයක් ලෙස දුක්ගන්නා නිළධාරියෙකු පත් කර ඔහුට විෂයක් ලෙස ලබා දීම මෙහි අරමුණ බව ප්‍රකාශ කරන ලදී.
ගරු මන්ත්‍රි කේ හැරිසෙන්ස් මැතිතුමා යම් දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව එම දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් වර්ථමාන තත්වය සොයා බැලීමේ හැකියාව පවතින්නේ ද යන්න විමසන ලද අතර ඉදිරියේදී

පත් කරනු ලබන කමිටුව හරහා වඩා හොඳ තත්වයකට ප්‍රාදේශීය සභාව ගෙන එමුයි යන්න සඳහන් කරමින් ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් දුක්ගැනවිලි කමිටු පත් කිරීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ කැමැත්ත පරිදී සභා සම්මත විය.

**06. තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයේ වැඩිවන 20% බදු ප්‍රතිශතය සංශෝධනය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයේ 2022 වර්ෂය වෙනුවෙන් බදු දීමේදී ගිවිසුම් ප්‍රකාරව වැඩි වන 20% බදු ප්‍රතිශතය වෙනුවට 2021 වර්ෂය වෙනුවෙන් ගෙවූ කුලී ප්‍රමාණයම ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස එහි බදුකරු විසින් ඉල්ලුම්කර ඇති බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවද මෙහි තක්සේරු මුදල් රු 50,000 ලෙසට දක්වා ඇති හෙයින් තුරුළිය සෙවණ නිවාඩු නිකේතනය සඳහා 2022 වර්ෂය වෙනුවෙන් 20% බදු ප්‍රතිශතය වෙනුවට 5% බදු ප්‍රතිශතය දක්වා අඩු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්තිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයේ වාර්ෂිකව වැඩි වන බදු ප්‍රතිශතය 20% සිට 5% දක්වා අවම කිරීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවය මත සභා සම්මත විය.

**07. කුඩා නෙළුබැව දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කිරීමට යෝජිත භූමිය පවරා ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.13,000,000.00 ක මුදලක් වෙන් වී ඇති බවත්, එය ඉදි කිරීම සඳහා මීට පෙර යෝජනා වී තිබූ නෙළුබැව වෛද්‍ය නිල නිවාස භූමිය සම්බන්ධව පවතින ගැටළුව නිසා වෙනත් ඉඩමක් අවශ්‍ය වී ඇති බවට ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති බවත් ඒ සඳහා මේ වන විට කිසිදු ප්‍රයෝජනයක් නොගන්නා අංක 265 කුඩා නෙළුබැව ග්‍රාම නිලධාරී වසමේ සමූපකාර පටුමගේ පිහිටි ඉඩම නිදහස් කර දෙන ලෙසට ප්‍රාදේශිය ලේකම් තුමා විසින් ඉල්ලීමක් කර ඇති බැවින් අදාල භූමිය ලබා දී ඉදිකිරීමෙන් අනතුරුව නැවත පවරා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී. බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාව ලේකම් පාලන කාලයේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කරන අවස්ථාවේදී එය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකිරීමට අවශ්‍ය වුවත් කුඩා නෙළුබැව ක්‍රිඩා පිටිය, දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ තිබුණු බවත්, අක්කර 3ක පමණ පවතින පොදු ක්‍රීඩා පිටිය පසෙක පෙර පාසලත්, ප්‍රජා ගොඩනැගිල්ලත්, කාය වර්ධන මධ්‍යස්ථානයත් තිබියදී එදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිට්ටනිය අවසාන භූමියේ ඉදිකලා නම් සියළුම රාජ්‍ය ආයතන එම භූමියේ පවත්වාගෙන යාමේ හැකියාව පැවති බවත්, ක්‍රීඩා පිටියක් මාර්ගයට ආසන්නයේ පැවතියානම් එම ක්‍රීඩා පිටියේ පවතින වටිනාකම අති මහත් වන බවත්, කුඩා නෙළුබැව සති පොළ භූමිය මේ වන විට ඉතා වටිනාකමක් සහිත භූමියක් වන බැවින් ඒ තුළ පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම අපරාධයක් බවත්,එවැනි මාර්ගය ආසන්නව ක්‍රිඩා පිටියක් ඉදි කිරීම කෙතරම් ප්‍රයෝජනවත්ද යන්නත්, ප්‍රකාශ කරමින් දැනට පවත්වාගෙන යන පෙරමඟ පෙර පාසල පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දී ඇති නෙළුබැව ක්‍රිඩා පිටියේ

ඊෂාන ප්‍රෙද්ශයේ කොටසේ අක්කර ½ ක භූමිය තුල දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කිරීමේ හැකියාව පවතින්නේ වඩාත් සුදුසු බව සඳහන් කරන ලදී.

තවද නෙළුබැව මංසන්දියේ ඉදි කරන කඩ කාමර සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට විරුද්ධව පුවත්පතේ පල වූ අවස්ථාවේ තමන්ට දැඩි ලෙස කණගාටු වූ බවත්, ගරු සභාපතිවරයාගේ බලය නොදැන එලෙස ප්‍රකාශයන් සිදු කිරීම කොපමණ වැරදි සහගතද යන්නත් මේ වන විට ඉදි කරන නෙළුබැව කඩ කාමර ඉදි කරන ආකාරය සම්බන්ධයෙන්ද පවතින්නේ දැඩි කණගාටුවක් බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී තුමා විසින් ඉදිරිපත් කල ප්‍රකාශය සුදුසු බව ප්‍රකාශ කරමින් මේ සඳහා කමිටුවක් පත් කර කමිටු තීරණයයට අදාල භූමිය කුමක්ද යන්න හඳුනාගනිමුයි ප්‍රකාශ කරමින් කමිටු සාමාජිකයින් ලෙස

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා
ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා
ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා
ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා
ගරු මනත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා
ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
තාක්ෂණ නිලධාරී -ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා

පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර මේ සඳහා ප්‍රාදේශිය ලේකම්තුමාද සහභාගි කර ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය ස්ථානය තීරණය කිරීමට තීරණය විය.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> කලින් ඉදිරිපත් කල භූමියට වඩා මෙම භූමිය හොඳ බවට හැගී ගියත් මෙහිදි අදාල ක්‍රිඩා පිටියේ ක්‍රිඩා සමාජය හා සාකච්ඡා කල යුතු වන බවත්, අළුතින් ඉද් කරන ගොඩනැගිල්ල තුල දැනට පවත්වාගෙන යන පෙර පාසලම පිහිටුවිය යුතු බවත්, ඒ සඳහා සභා තීන්දුවක් ලබා ගත යුතු බවත්, සඳහන් කරන ලදී. තවද අදාල ගොඩනැගිල්ල ඉදි කිරීමේදී ඊට අදාල සැළැස්මද සභාගත කිරීමට කටයුතු කරන ලෙසද සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි අදාල කමිටුව පත් කර කමිටු තීරණය මත පදනම් වී පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කිරීමේ භූමිය තෝරා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුාම කමිටු පත් කිරීම සඳහා ගෙන ඇති යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පත් කරන ලද කමිටුවේ තීරණය මත අවශ්‍ය භූමිය තෝරා ගැනීමට තීරණය විය.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල නිවැරදි පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ස්තුතිය පිරිනැමිය යුතු බවත්, නාච්චාදූව කොට්ඨාශයේ ගොවි ජනතාවගේ ගොවි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඉදි කරන ලද පාල භූමිය මේ සඳහා සුදුසු නොවන බවත්, නෙළුබැව ක්‍රිඩා පිටිය ආසන්නයේ මෙම පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කිරීමේදී උල කාර්යාල භූමිය භාවිතා නොකල යුතු බවත්, ක්‍රිඩා පිටියට අදාල භූමියද සුරක්ෂිත වන සේ දරුවන්ගේ ආරක්ෂාවද සැළසෙන පරිදී පිවිසුම් මාර්ගයක්ද සහිතව පෙර පාසල් පාලිකාවට හානියක් නොවන සේ අදාල ඉදි කිරීම සිදු කිරීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී.

**08.** **පෙර පාසල් මාසික ගාස්තුව සංශෝධනය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂය වෙනුවෙන් පෙර පාසල් ගාස්තු ලෙස මාසිකව රු.1600.00 ක් හා 10% සේවා ගාස්තුව ලෙස රු.160.00 ක් අය කිරීමට ගැසට් කර ඇති නමුත්, මෙම අය කරන මුදල් ප්‍රමාණය ප්‍රදේශයේ අනෙකුත් පෙර පාසල් හා සංසන්දනය කිරීමේ දී එම මුදල් ප්‍රමාණය අධික වන බැවින් එම මුදල රු.1500 .00 ක් හා 10% සේවා ගාස්තුව සමග රු.150.00ක් ද සමගින් සම්පූර්ණ මුදල රු. 1650.00ක් ලෙසට සංශෝධනය කර දෙන ලෙස අදාල පෙර පාසල් ගුරුභවතුන් විසින් ඉල්ලීම් කර ඇති බැවින් අදාල මුදල් රු.1760.00 සිට රු.1650.00 දක්වා අවම කර සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පෙර පාසල් අධ්‍යාපනය හා එහි පාලිකාවන් සම්බන්ධයෙන් අප අවධානය යොමු කල යුතු බවත් ඔවුන් දරුවන්ගේ දෙවන මව වන බවත්, ප්‍රජා සත්කාරයක් ලෙස හා සභාවේ වගකීමක් ලෙස අවට පෙර පාසල් සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් සම්පූර්ණ වටිනාකම රු.1500.00 ලෙස අදාල ගාස්තුව සංශෝධනය කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී හැරිසෙන්ස් මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල සංශෝධනයට අනුව අදාල පෙර පාසල් ගාස්තුව සංශෝධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමාගේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පෙර පාසල් ගාස්තුව රු.1760.00 සිට රු.1650.00 දක්වා අවම කර සංශෝධනය කිරීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ කැමැත්ත පරිදී සභා සම්මත විය.

**09.** **ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක අන්ගර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දිවයින පුරා ප්‍රාදේශීය සභා නගර සභා හා පළාත් සභා වලට අයත් තෝරා ගනු ලැබූ මාර්ග කි.මී 3000 පමණ වැඩි දියුණු කිරීමට සැළසුම් කර ඇති බැවින් ඒ සඳහා මෙම බල ප්‍රෙදශයේ තුරුළිය සෙවණ හන්දියේ සිට ශ්‍රාවස්තිපුර සින්නික්කුලම දක්වා මාර්ගය යෝජනා වී ඇති බැවින් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදාල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල ව්‍යාපෘතිය බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**10.** **නව පුද්ගලික සහයක වරයෙකු බඳවා ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා දැනට තම පුද්ගලික සහයක ලෙස රාජකාරි ඉටු කල නිරෝශණ ශෂික සාරංග යන අය වෙනත් රැකියාවක් සඳහා යන බව සඳහන් කරමින් 2022 පෙබරවාරි මස සිට සිය පුද්ගලික සහයක ලෙස චමෝත් චන්දිමාල් යන අය බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා නව පුද්ගලික සහයකවරයෙකු බඳවා ගැනීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 පෙබරවාරි මස සිට සිය පුද්ගලික සහයක ලෙස වමෝත් චන්දිමාල් යන අය බඳවා ගැනීම සුදුසු බවට වූ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**11. ප්‍රජා මණ්ඩල මාර්ගෝපදේශ සංග්‍රහය අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතතුමා බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීමට අදාල ප්‍රජා මණ්ඩල මාර්ගෝපදේශ සංග්‍රහය මහ සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවටත්, බල ප්‍රදේශයේ සෑම තුලානයකම ප්‍රජා මණඩල පිහිටුවීම සුදුසු බවටත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදාල යෝජනාව ස්ථිර කරන ලද අතර අදාල ප්‍රජා මණ්ඩල මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටපත්් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිප.් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රජා මණ්ඩල මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා මෙන්ම ප්‍රජා මණ්්ඩල පිහිටුවීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 පෙබරවාරි මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**උ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 ජනවාරි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙවීම් වාර්ථාවේ සේවක වැටුප්, මන්ත්‍රී දීමනා, පරිපාලන වියදම් හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ බව සඳහන් කරන ලදී.

**ඌ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය, ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා, ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය, ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය ,ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2022.02.17 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.05 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2022.03.22 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | ........................................... |
| බී. එච් ප්‍රදීප් නිශාන්ත, | එස්. බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ. නු. ප ප්‍රාදේශීය සභාව, | නැ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |